**ශීර්ෂය - 332 ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**
-----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණනකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදි වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව වෙනත් මූලධන වියදම රු.902,764,920 ක් වී තිබුණ ද, දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එය රු.1,776,560ක් අඩුවෙන් රු.900,988,360ක් ලෙස දක්වා තිබුණි. | මෙය ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී දෙපාර්තමේන්තු වියදම් ලෙසට ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | 332-1-1-2 – 2506-13 වැය විෂය යටතේ වූ යුනිසෙෆ් ව්‍යාපෘතියෙන් ප්‍රතිපාදන ලැබීම් රු.1,776,560 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් මූලධන වියදම් යටතේ නොදක්වා වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදමක් සේ සළකා අග්‍රිම ගැලපුම් ගිණුමේ දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**------------------------**

**දේපළ පිරියත හා උපකරණ**

**------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ----------------------- | ---------------------------------- | ----------- |
| මූල්‍ය තත්ව ප්‍රකාශය හා ඒ.සී.ඒ.6 ආකෘති පත්‍රය අනුව රු. 37,967,000 ක් වටිනා ප්‍රවාහන උපකරණ දෙපාර්තමේන්තුව සතුව පවතින බව දක්වා තිබුණද, ඒ තුල රු. 31,500,000 ක් වටිනා වෙනත් ආයතන වලට අයත් මෝටර් වාහන 13 ක් ඇතුලත් බව දෙපාර්තමේන්තු පොත් හා ස්ථාවර වත්කම් ලේඛනය පිලිබඳ පරීක්ෂාවේදී විගණනයට අනාවරණය විය. තවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ඒ.සී.ඒ. 6 ආකෘති පත්‍රය තුල සටහන් කර ඇති රු.800,000 ක් වටිනා මෝටර් රථය හා රු. 7500 ක් වටිනා මෝටර් බයිසිකල් හතරක් විගණනයේදී භෞතිකව සත්‍යාපනය කර ගත නොහැකි විය.ඉහත ඌනතා හේතුවෙන් දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ස්ථාවර වත්කම් වටිනාකමේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | දැනටමත් දෙපාර්තමේන්තුවේ වාහන විධිමත් ලෙස පවරා ගැනීමට කටයුතු කර ඇති බැවින්, ඒ පිළිබඳ පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. . | දෙපාර්තමේන්තු ස්ථාවර වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන හා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කල යුතු වීම. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සහ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ලෙස පිළිවෙලින් රු. 1,069,628,013ක් සහ රු.202,731,621ක් දක්වා තිබුණි. එසේ වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් රු.1,071,404,573ක් හා වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් රු. 200,955,061ක් දරා තිබීම හේතුවෙන් එම වියදම් අතර රු.1,776,560 ක් බැගින් වූ වෙනසක් නිරීක්ෂණය විය | මෙය ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී දෙපාර්තමේන්තු වියදම් ලෙසට ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) <u>ඇප ලේඛනය</u> | | |
| මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැම්පත් පාස් පොත් විවෘත කර ඇප තැම්පත් ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 891 (1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| (ආ) <u>වාහන ලේඛනය</u> | | |
| මුදල් රෙගුලාසි 1646 (ඉ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් එම වාහනවල විස්තර ඇතුලත් කර වාහන ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මේ වන විට වාහන ලේඛනයක් සකස් කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 1646 (ඉ) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි වාහන ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |

(ඇ) <u>වාහන ලොග්පොත්</u>

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි. 1645 (ආ) ප්‍රකාරව වාහන ලොග්පොත් නඩත්තු කර තිබුණ ද ඒවා යාවත්කාලීන කර නොතිබුණි. | වාහන ලොග් පොත් නඩත්තු කර යාවත් කාලීන කිරීමට කටයුතු කර ඇත. | වාහන ලොග්පොත් ක්‍රමානුකූලව නඩත්තු කල යුතු වීම. |

(ඈ) <u>හානි පාඩු ලේඛනය</u>

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පාඩු ලේඛනය නඩත්තු කර නොතිබුණි. | හානි පාඩු ලේඛනය සකස් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 110 හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි හානි පාඩු ලේඛනය නඩත්තු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වාහන අනතුරු ලේඛනය නඩත්තු කර නොතිබුණි. | වාහන අනතුරු ලේඛනය සකස් කිරීමට කටයුතු කර ඇත. | වාහන අනතුරු ලේඛනය නඩත්තු කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | --------------------------------------- | ----------- |
| සමාලෝචිත වර්ෂය තුල මූලධන වියදම් සඳහා ලද ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,324.5 ක් වුවද ශුද්ධ වියදම රු.මිලියන 905.02ක් වුයෙන් ඉතිරිය රු.මිලියන 419.48 ක් වී තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයට ඉතිරිය සියයට 32 ක් වී තිබුණි | වසර අවසාන වන විට අක්මුදල් ප්‍රමාණවත් නොවීම , රටේ පැවති කොරෝනා තත්ත්වය තුල ක්ෂේත්‍රයට යාමේ පැවති ගැටළු, කාර්ය මණ්ඩලය කැඳවීමේ ගැටළු හා ගෙවීම් කටයුතු සිදු කිරීමට නොහැකිවීම මත ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකිවිය. එබැවින් අදාළ ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුනරාවර්තන හා මූලධන වැය විෂයය සංකේත හයකට (06) කට අදාල ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 18 සිට සියයට 68 දක්වා පරාසයක් ගෙන තිබුණි. | 2020 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වය නිසා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) <u>ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | | | |
| (i) මුදල් රෙගුලාසි 570 | දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම් වලට අදාල එකතුව රු.27,340,534 ක් වූ තැන්පතු 287 ක් වසර දෙකට වඩා වැඩි කාලයක් දක්වා රාජ්‍ය අදායමට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2016 හා 2017 වර්ෂයේ රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරමින් පවතී. එම වර්ෂවලදී ව්‍යාපෘති සඳහා විවිධ ආයතන වලින් ලද මුදල් වලින් මේ වන විට අවසන් වී ඇති ව්‍යාපෘති වල ඉතිරි මුදල් එම ආයතන වලට යැවීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 371(ඇ) | 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා අවස්ථා 6කදි විවිධ කාර්යයන් සඳහා නිකුත් කල රු.117,150 ක තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය අවසන් වූ වහාම නිරවුල් කර නොතිබුණි. | 2020 වර්ෂය පුරාම පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් නිලධාරීන් කාර්යාලයට අවශ්‍ය අවස්ථාවන්හිදී පමණක් සේවයට කැඳවීම ඒ ඒ කාර්යයන් අවසන් කිරීම ප්‍රමාද වීමත් නිසාවෙන් අත්තිකාරම් පියවීම ප්‍රමාද විය. | තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය අවසන් වූ වහාම නිරවුල් කළ යුතු වීම. |
| (iii) මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | • 2020 ජුලි 25 වන දින අනතුරට ලක් වූ අංක HP6442 දරන වාහනයට අදාල පරීක්ෂණ කටයුතු අනතුර සිදු වී මාස 7ක් ගත වන විටත් සිදු කර නොතිබුණි. | • HP 6442 දරණ වාහනයට අදාළව පරීක්ෂණ කටයුතු මේ වන විට අවසන් වී වාර්තා ද භාර දී තිබේ. | පාඩු සහ අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | • අනුරාධපුර වැඩභාර නිලධාරී කාර්යාලයේ 2018 නොවැම්බර් 10 දින සිදු වූ රිය අනතුර සම්බන්ධයෙන් අලාභ හානි නිශ්චය කොට අවසන් වාර්තාව ඉදිරිපත් කිරිම 2021 මැයි 10 දින වන විටත් සිදු කර නොතිබුණි. | • අනුරාධපුර කාර්යාලයේ වාහනයේ අලාභය සම්බන්ධයෙන් අදාළ වාර්තා මෙතෙක් භාරදී නොමැත. | -එම- |
| | • නුවරඑළිය වැඩ භාර නිලධාරී කාර්යාලයේ සිදු වු රු.101,800 ක් වටිනා පරිගණක උපාංග නැතිවීම සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කොට තිබුණද, ඒ තුල අලාභය සඳහා වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් නැවත විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට රේඛිය අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කොට තිබුණි. කෙසේ වෙතත් 2021 අප්‍රේල් 20 දිනවන විටත් එකී පරීක්ෂණ නිම කර නොතිබුණි. | • නැවත වාර්තාවක් සකස් කිරීම මෙම වසංගත තත්වය හේතුවෙන් ප්‍රමාද වී ඇත. එහෙත් මේ වනවිට වාර්තාව සකස් කර තිබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv) මුදල් රෙගුලාසි 394(ආ) | මාස හයකට වැඩි කාලයක් මුදල් කරගෙන නොතිබූ රු.42,090 ක් වටිනා චෙක්පත් අටක් අවලංගු කිරීමට හෝ අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීමට 2021 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | රු.25,090 ක් වටිනා චෙක්පත් වෙනුවෙන් 2021 මැයි 05 වන දින හිලව් චෙක්පත් නිකුත් කල අතර රු.17,000 ක් වන චෙක්පත් 2021 මැයි 07 වන දින රාජ්‍ය ආදායමට බැර කරන ලදී. | මාස හයකට වැඩි කාලයක් මුදල් කරගෙන නොතිබූ චෙක්පත් අවලංගු කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

(ආ) <u>රාජ්‍ය මුදල් චක්‍රලේඛ</u>

| | | | |
|---|---|---|---|
| (i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.2 ඡේදය | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව තුල ඇතුලත් 47 වාර්තාව අනුව විනාශ කල යුතු හෝ අලුත් වැඩියා කල යුතු ලෙස හඳුනාගත් භාණ්ඩ සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 30 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනුරාධපුර, රත්නපුර, මුලතිව්, කිලිනොච්චිය හා මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විනාශ කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරි දිස්ත්‍රික්ක වල ප්‍රයෝජනයට ගත නොහැකි අබලි භාණ්ඩ විනාශ කිරීමේ කටයුතු 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් වූ පසු සිදු කිරීමට කටයුතු කරමි. | භාණ්ඩ සමීක්ෂණයේ දී විනාශ කල යුතු හෝ අලුත් වැඩියා කල යුතු ලෙස හඳුනාගත් භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වීම. |
| (ii) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | | | |
| - 3.1 ඡේදය | දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා මූල සංවිධාන වෙත ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පවරා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ව්‍යාපෘති සඳහා ප්‍රජා ජල සංකල්පය පිළිබඳ අවබෝධයක් ඇති ප්‍රජා ජල සමිති සඳහා කොන්ත්‍රාත් ලබා දීම සිදු කරයි. | ප්‍රජා මූල සංවිධාන වෙත ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පැවරීමේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | -3.2 (iv) ඡේදය | ප්‍රසම්පාදන කාර්යයන් පිරිනැමීමෙන් පසුව අදාල සංවිධාන විසින් වැඩ විෂයයන් උප කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. | යසමිති විසින් උප කොන්ත්‍රාත්කරුවන් වෙත කොන්ත්‍රාත් ලබාදීමක් සිදුවූ බවට වාර්තා වී නොමැත. | ප්‍රජා මූල සංවිධාන වෙත ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පැවරීමේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ඈ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රෙල්ඛයේ 07 ඡේදය | ආයතනය සතු සියළු වත්කම් සම්බන්ධ විස්තර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ලබා දීය යුතු වුවද, 2021 මැයි 30 දින වන විටත් එසේ සිදු කර නොතිබුණි. | 2020 වර්ෂයේ අළුතින් මිලදී ගන්නා ලද යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ පිළිබඳ තොරතුරු වාර්තා 2020 දෙසැම්බර් 31 දින කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යවා ඇත. | ආයතනය සතු සියළු වත්කම් සම්බන්ධ වාර්තා නියමිත දිනයන්හි කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ලබා දීය යුතු වීම. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.5 ඡේදය | මානව සම්පත් සැලැස්මක් සකස් කර ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවිධානය කිරීම හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම පිළිබඳ වගකිව යුතු නිලධාරියකු පත් කර නොතිබුණි. | මේ සඳහා වෙනම අංශයක් ඇති කර වගකිව යුතු නිලධාරීන් පත් කර ඇත. | මානව සම්පත් සැලැස්ම සකස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවිධානය කිරීම හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| | **(ii)** අංක 30/2016 දරන හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 3.1 ඡේදය | දෙපාර්තමේන්තුව සතු වාහනවලට අදාලව ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබූ බව එම වාහන වලට අදාල ලොග් පොත් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | එය කඩිනමින් සිදු කිරීමට සැලසුම් කර ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව වාහනවල ඉන්ධන පරීක්ෂාවන් සිදු කල යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුව පිහිටුවා වසර හයකට ආසන්න කාලයක් ගත වුවද දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාල පනතක් සම්මත කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කළමනාකාරීත්වය අපොහොසත්ව පැවතුණි. ඒ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ නෛතික වලංගුතාවය මෙන්ම ඒ යටතේ ලියාපදිංචි කොට ඇති ප්‍රජා මූල සංවිධාන පාලනය කිරීමට ඇති අධිකාරී බලය සම්බන්ධයෙන් විගණනයේදී ගැටළුකාරී වේ. | මේ වන විට ජාතික පානීය ප්‍රජා ජල සංවර්ධන පනත සකස් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත. | දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාල පනත සම්මත කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 3.2 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014/2/17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කොට නොතිබුණි. | 2020 වර්ෂයට අදාළව අතුරු සම්මත ගිණුම යටතේ ප්‍රතිපාදන අනුමතවීම අදියර 04 ක් යටතේ සිදුවීම නිසා විධිමත් පරිදි ක්‍රියාත්මක සැළැස්මක් සකස් කිරීමට නොහැකි විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂයක් සඳහාම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු වීම. |

### 3.3 ව්‍යාපෘති නිම නොකර අත හැරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති දිස්ත්‍රික්ක 22 කට අයත් ප්‍රජා මූල සංවිධානයන්හි ජල ව්‍යාපෘති 329 ක් 2005 සිට වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අක්‍රීයව පැවතුණි. කෙසේ වෙතත් මේ අතුරින් කෑගල්ල, මන්නාරම, ත්‍රිකුණාමලය හා මාතර යනාදී | අයවැය යෝජනා මඟින් අනුමත කරන ලද ප්‍රතිපාදන තුලින් ඉදිරි වසර 05 තුල සියළුම ව්‍යාපෘතිවල පුනරුත්ථාපන කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. | අක්‍රිය තත්වයේ පවතින නැවත සක්‍රිය තත්වයට පත් කළ හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

දිස්ත්‍රික්ක තුල මේ වන විට අක්‍රියව පවතින ව්‍යාපෘති නැවත සක්‍රිය තත්වයට පත් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. තවද, මන්නාරම දිස්ත්‍රික්කය ලියාපදිංචි වී ඇති රු.මිලියන 57.5 ක් වැය දරා නිම කර තිබූ ප්‍රජා මූල සංවිධාන අටකට අයත් ජල ව්‍යාපෘතීන් මෝටර් අක්‍රීය විම, ටැංකිවලට හානි වී තිබීම, විදුලි බිල් නොගෙවා තිබීම වැනි හේතූන් නිසා අක්‍රියව පවතින බව නිරීක්ෂණය වුවද, ඒවා නැවත සක්‍රීය කොට ජනතා අයිතියට පත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ හා 2019 දෙසැම්බර් 31 දිනට අවසන් කල යුතුව පැවති පිරිවැය රු. මිලියන 1778 ක් වූ ව්‍යාපෘති 123 කින් පිරිවැය රු.මිලියන 597 ක් වූ ව්‍යාපෘති 35 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි. තවද, රු.59,218,151 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත මාතර දිස්ත්‍රික්කයේ පොරම්බකනන්කෙ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ක්‍රියාත්මක කර තිබූ ප්‍රතිභා ප්‍රජා මූල සංවිධානයේ ව්‍යාපෘති කටයුතුවල 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 40 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | නල එලීම් කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අවසර ලබාදීම ප්‍රමාදවීම, විදුලි බල මණ්ඩලයේ ඇස්තමේන්තු ලබාදීම ප්‍රමාදවීම, රටතුල පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් සැපයුම්කරුවන්ට නියමිත පරිදි අදාල භාණ්ඩ සැපයීමේ ප්‍රමාදයන් සිදු වීම වැනි දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ කරුණු හේතුවෙන් ප්‍රමාදවීම් සිදු වී ඇත. | සැලසුම් කල පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත හම්බන්තොට දිස්ත්‍රික්කයේ 2018 ජුනි 17 වන දින ආරම්භ කොට තිබූ හා සමාලෝචිත වර්ෂය අවසානයට නිම කළ යුතුව පැවති පිරිවැය රු.මිලියන 55.9 ක් වූ අඟුණුකොළපැලැස්ස පහළගම ඒකාබද්ධ ප්‍රජා ජල ව්‍යාපෘතියේ ඉදි කිරීම් 2021 මාර්තු 30 දින වන විටත් නිම කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2018,2019 හා 2020 වර්ෂයන්හිදී ආරම්භ කර තිබූ ජල ව්‍යාපෘති අතුරින් 2020 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කල යුතුව පැවති පිරිවැය රු.50,483,201 ක් වූ ව්‍යාපෘති 25 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබූ අතර එයින් ව්‍යාපෘති හතරක භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ දී ඇස්තමේන්තු කළ ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන 2020 සැප්තැම්බර්, දෙසැම්බර් කාල සීමාවන් තුල අනුමත කරන ලදී. බොහොමයක් ව්‍යාපෘතිවල මිලදී ගැනීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කල ද, රට තුල පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් එම ව්‍යාපෘති සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම ප්‍රමාද වීමෙන් ඉදි කිරීම් කටයුතු සිදු කිරීම ප්‍රමාද විය. | -එම- |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රජා ජල අභිමානි වැඩසටහන යටතේ 2019 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.55,571,391 ක් වූ පනන්වෙල මී ඇල්ල ප්‍රජා මූල සංවිධාන ජල සැපයුම් ව්‍යාපෘතිය යටතේ මුළු දුර මීටර් 36,110ක් සඳහා ජල නල එළීමට ඇස්තමේන්තු සකස් කර තිබූ අතර ඒ සඳහා රු. 8,837,496 ක වියදමක් දරා ජල නල මිලදී ගෙන තිබුණි. කෙසේවෙතත්, 2021 පෙබරවාරි 01 දින වන විටත් එළා තිබූ මුළු ජල නල ප්‍රමාණය මීටර් 30,214 ක් පමණක් වූ අතර ඒ | මාර්ග අවසරය නොලැබීම නිසා කිලෝමීටර 05 ක් පමණ දුර ප්‍රමාණයක් නල එළීම ප්‍රමාද වූ අතර, මේවන විට නල එළීම කටයුතු අවසන් අදියරේ පවතී. නල එළීම නිම වූ බවට සකස් කර ගෙවීම සඳහා බිල්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. | බිල්පත් අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම් කිරීම යන කාර්යයන්හීදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් වටිනාකම රු. 1,389,982 ක් වූ ඉතිරි නල මීටර් 5,896 සඳහා භාවිතා නොකර පනන්වෙල ප්‍රජා මූල සංවිධානයේ ලේකම්වරයාගේ ඉඩමේ ගොඩ ගසා තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය යටතේ එළිය යුතු මුළු දුර ප්‍රමාණය වන මීටර් 36110 සඳහාම ජල නල ඇතිරීම වෙනුවෙන් මුදල් ගෙවා තිබුණෙන්, පුහුණු ශ්‍රමය වෙනුවෙන් රු. 126,710 ක් ද, පස්කැණීම් හා නැවත පිරවීම සඳහා රු.1,356,080 ක්ද වශයෙන් ඉටු නොකළ කාර්යයන් සඳහා රු.1,482,790 ක් ප්‍රජා මූල සංවිධානයන්ට වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ආ) | තවද,ඉහත වැඩසටහන යටතේ 2019 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු. 38,028,244 ක් වන ලේනබටුව සපුගොඩ ශක්ති ප්‍රජා මූල සංවිධාන ජල සැපයුම් ව්‍යාපෘතිය යටතේ මුළු දුර මීටර් 19,900 ක් සඳහා ජල නල එළීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් රු. 5,433,810 ක වියදමක් දරා ජල නල මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2021 පෙබරවාරි 12 වන දිනට ජල නල එළා තිබූ මුළු දුර ප්‍රමාණය මීටර් 11,974 ක් පමණක් වූයෙන් මීටර 7,926 ක් එළීම සඳහා රු.2,158,979 ක වටිනාකමකට මිලදී ගෙන තිබූ ජල නල භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය යටතේ එළිය යුතු මීටර 19,900 ක් වන මුළු දුර සඳහාම ඉදිරිපත් කළ බිල්පත් සඳහා මුදල් ගෙවා තිබීම හේතුවෙන් පුහුණු ශ්‍රමය වෙනුවෙන් රු. 164,490 ක් ද, පස්කැණීම් හා නැවත පිරවීම සඳහා රු.1,726,380 ක් ද වශයෙන් ඉටු නොකළ කාර්යයන් සඳහා රු.1,890,870 ක් ප්‍රජාමූල සංවිධානයන්ට වැඩිපුර ගෙවා තිබුණි. | නල එළීම නිම වූ බවට සකස් කර ගෙවීම සඳහා බිල්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. | බිල්පත් අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම් කිරීම යන කාර්යයන්හිදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 3.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යය සාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණු ද එසේ සිදු කොට නොතිබුණි. එමෙන්ම 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු තිබූ 2015 සිට 2019 දක්වා වූ වර්ෂයන්ට අදාල දෙපාර්තමේන්තු කාර්යය සාධන වාර්තා 2021 මැයි 31 දින වන විටත් පාර්ලිමේනතුවේ සභාගත කර නොතිබුණි. | 2015 සිට 2019 වර්ෂය දක්වා කාර්ය සාධන වාර්තා සකස් කර අවසන් කර ඇත. ඉදිරි මාස 02 ක ඇතුළත සභාගත කිරීමට කටයුතු කරයි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යය සාධන වාර්තාව පිළියෙල කළ යුතු අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික කාර්යය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වීම. |

## 3.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) **ධාවනයට යොදා නොගන්නා වාහන** | | |
| දෙපාර්තමේන්තුව සතු මෝටර් රථ පහක් ධාවන තත්වයේ පවතින නමුත් එම වාහන අලුත් වැඩියා කිරීමට කටයුතු කිරීමෙන් තොරව දිගු කාලයක් දෙපාර්තමේන්තු භූමියේ ගාල් කර ඇති බව 2021 පෙබරවාරි මස 15 වන දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | වාහන තුනක් දැනට අලුත්වැඩියා කර ක්‍රියාකාරී තත්වයේ පවතී. එක් කැබ් රථයක් සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ කාර්මික නිලධාරී විසින් පරීක්ෂා කර බලා ලබා දී ඇති නිර්දේශ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය. ඉතිරි වාහනය සඳහා අමතර ප්‍රතිපාදන වෙන් කර ගෙන නොපමාව අලුත්වැඩියා කිරීමට හැකියාව ඇත. | ධාවන තත්වයේ පවතින වාහන ධාවනයට යොදා ගැනීමට කටයුතු කල යුතු වීම. |

(ආ) **දෙපාර්තමේන්තු වත්කම් ඌන උපයෝජනය**

| | | | |
|---|---|---|---|
| (i) | ඉහත (අ) හි සඳහන් පරිදි දෙපාර්තමේන්තුව සතුව වාහන පහක් අලුත්වැඩියා කොට ධාවනය කල හැකි තත්වයේ පැවතිය ද, සමාලෝචිත වර්ෂය තුල එම රථ අලුත්වැඩියා කිරීමෙන් තොරව කුලී පදනම මත ලබාගත් මෝටර් රථ පහක් ධාවනයට යොදා ගැනීම වෙනුවෙන් වර්ෂය තුල රු. 3,905,625 ක් මුදලක් වැය කර තිබුණි. | 2020 වර්ෂයේ වාහන අළුත්වැඩියාව සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදලින් සියළුම වාහන අළුත්වැඩියාවන් කිරීමට තරම් ප්‍රමාණවත් නොවූ අතර, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වාහන පහක් කුලී පදනම මත ගැනීම සඳහා මුදල් ලැබුණි. ඒ අනුව කුරුණෑගල, අනුරාධපුරය, පුත්තලම හා වව්නියාව යන දිස්ත්‍රික් සඳහා මෙම වාහන ලබාදෙන ලදී. මේ වන විට එම වාහන සියල්ල ආපසු භාදී ඇති අතර 2021 වර්ෂයේ ලද ප්‍රතිපාද වලින් වාහන 03ක් අළුත්වැඩියා කර ඉහත දිස්ත්‍රික් සඳහා ලබා දෙන ලදී. | ධාවන තත්වයේ පවතින වාහන ධාවනයට යොදා ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ii) | දෙපාර්තමේන්තුවේ ගාල්ල හා මහනුවර දිස්ත්‍රික් කාර්යාල සඳහා ප්‍රමාණවත් රියදුරන් අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් එම කාර්යාල සඳහා අනුයුක්ත කර තිබූ වාහන දෙකක් 2020 ඔක්තෝම්බර් හා 2020 අගෝස්තු මස සිට 2021 අප්‍රේල් 30 දින දක්වා ධාවනය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තුව සඳහා අනුමත රියදුරු සංඛ්‍යා 36 ක් වන අතර මේ වන විට පුරප්පාඩු 20 ක් පවතී. | සියළුම වාහන උපයෝජනය කල හැකි වන පරිදි ප්‍රමාණවත් රියදුරන් අනුයුක්ත කල යුතු වීම හා වාහන කුලියට ලබා ගැනීමට පෙර නිෂ්කාර්ය වාහන ධාවනයට යොදා ගත යුතු වීම. |

**3.8 රජයේ නිලධාරීන්ට ඇප තැබීම**

---------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ------------------------------ | ------------ |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (1) (ග) ප්‍රකාරව ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තැබිය යුතු වුවද එසේ ඇප තබා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි. | ඇප තැම්පත් පාස් පොත් විවෘත කර ඇප තැම්පත් ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කරමි. | ඇප අය කර ගත යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර ඇප ලේඛනය නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.9 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා වන පිරිවිතර අදාල ප්‍රසම්පාදන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට විස්තර කල යුතු විය. එහෙත් 2020 ජූනි 19 වන දින මිල කැඳවා තිබූ පොම්ප හා උපාංග සඳහා වන ටෙන්ඩරයේ පිරිවිතරයන් සංකීර්ණ වන බව ප්‍රසම්පාදන කමිටුව විසින් පසුව තීරණය කොට නැවත මිල කැඳවීම හේතුවෙන් පළමුවර මිල කැඳවීම වෙනුවෙන් දරා තිබූ රු.177,660 ක වියදම නිෂ්කාර්යය වී තිබුණි. | අදාල පිළිවිතර වලට අනුකූල මිල ගණන් ඉදිරිපත් නොවූ බැවින් තාක්ෂණ ඇගයුම් කමිටුව පිළිවිතර තවදුරටත් සරල කල යුතු බවට ද නැවත ටෙන්ඩර් කැඳවීමටද නිර්දේශ කර තිබින. ඒ අනුව නැවත පිළිවිතර වෙනස් කර ප්‍රසම්පාදන කටයුතු කරන ලදී. | ප්‍රසම්පාදන කටයුතු ආරම්භයට පෙර භාණ්ඩ පිරිවිතර නිශ්චිතව නිශ්චය කර ගත යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ තිරසාර සංවර්ධන අරමුණු ලෙස සැමට ජලය, තිරසාර කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධව දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ මඟපෙන්වීම් හා වැඩමුළු කිසිවක් ආයතනය විසින් පවත්වා නොතිබුණි.තවද, 2018 අප්‍රේල් 27 දිනැති අංක. එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට සම්බන්ධීකරණ කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙකු නම් කර නොතිබුණි. | මෙතෙක් නිලධාරීන් නම් කර නොමැති අතර ඉදිරියේදී නම් කර යැවීමට කටයුතු කරමි. | තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් නිකුත් කළ යුතු චක්‍ර ලේඛ නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ මඟ පෙන්වීම් හා වැඩමුළු ද පැවැත්විය යුතු වීම.තවද, මේ සම්බන්ධයෙන් වන වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සෑම සේවක කාණ්ඩයක් යටතේම අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 44 සිට සියයට 100 ක පරාසයක් ගන්නා බව නිරීක්ෂණය විය. එය අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 51 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | මේ වන විට මුළු පුරප්පාඩු 247 න් 144 ක් සම්පූර්ණ වී ඇති අතර අනිකුත් පුරප්පාඩු සම්පූර්ණ කර ගනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ඉංජිනේරු (සිවිල්) තනතුර සඳහා නිලධාරීන් 12 ක් අනුමත කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විට නිලධාරීන් හතක් පමණක් බඳවා ගෙන තිබූ අතර අතර ඉතිරි නිලධාරී පුරප්පාඩු පහ සම්පූර්ණ කර ගැනීමෙන් තොරව එක් නිලධාරියෙකුට දිස්ත්‍රික්ක කිහිපයක අධීක්ෂණ කටයුතු පවරා තිබුණි. | නිලධාරි හිඟය නිසා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හැකියාව ලැබී නොමැත. දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරින් 07 දෙනා මඟින් දිස්ත්‍රික්ක වෙන් කර ලබා දී ඇති ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇත. | -එම- |
| (ඇ) | කාර්මික නිලධාරී තනතුරු 30 ක් අනුමත කර තිබුණ ද, එම තනතුර සඳහා 2020 දෙසැම්බර් 31 දිනට එකඳු නිලධාරියකු ස්ථිර පදනමින් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, එම තනතුර සඳහා සේවකයින් පස් දෙනෙකු කොන්ත්‍රාත් හා පුහුණු පදනම මත බඳවාගෙන තිබූ අතර ඔවුන් ප්‍රජා මූල සංවිධාන ජල ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු වලට අදාල ඇස්තමේන්තු සැකසීම හා භෞතික ප්‍රගතිය අධීක්ෂණය කිරීම යනාදි ඉංජිනේරුමය කාර්යයන්වලද නියැලෙන බව ක්ෂේත්‍ර විගණනයේදී නිරීක්ෂණය විය. | 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරීන් පස්දෙනෙකු බඳවාගෙන ඇති අතර ඔවුන් දිස්ත්‍රික් ඉංජිනේරුවන්ට සහාය සේවා සපයනු ලැබේ. කාර්මික නිලධාරින් 23 ක් කොන්ත්‍රාත් පදනම මත මේ වන විට බඳවා ගෙන ඇත. ස්ථිර ලෙස බඳවා ගැනීමට 2021.04.23 දින ගැසට් නිවේදන පල කර ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන හා සැලසුම්) තනතුර සඳහා එක් නිලධාරියකු පමණක් අනුමත කර තිබුණ ද එම තනතුර සඳහා නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි. | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ තනතුරු 03 ක් අනුමත වී ඇත. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක අතිරික්තයක් නොපවතී. | අනුමත නිලධාරී සංඛ්‍යාව පමණක් බඳවා ගත යුතු වීම. |
| (ඉ) | දිස්ත්‍රික් කාර්යාලවට අනුයුක්ත කර ඇති ස්ථානභාර නිලධාරී, සංවර්ධන නිලධාරී, තාක්ෂණ සහකාර හා තාක්ෂණ නිලධාරී යන තනතුරු සඳහා රාජකාරී ලැයිස්තුවක් මගින් රාජකාරී පවරා නොමැති බව 2021 පෙබරවාරි 15 වන දින සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සියලුම නිලධාරීන් සඳහා විධිමත්ව රාජකාරී ලැයිස්තුවක් ලබා දී ඇත. | රාජකාරී ලැයිස්තුවක් මගින් නිලධාරීන්ට විධිමත් ලෙස රාජකාරී පැවරිය යුතු වීම. |